**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

පුරප්පාඩුව පවතින අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 5ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **<u>තෝරා ගනු ලබන ක්‍රමවේදය</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියකට අනුව, එම කමිටුව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ.

2. **<u>අයදුම්පත් යොමු කළ යුතු ආකාරය</u>**

මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, **2024.08.09** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවර "ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කර එවිය යුතුවේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

Jayasundara

**ජේ.එම්.තිලකා ජයසුන්දර**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

2024.07. 22